# පරස්පර හා බොරු

කපිල පීරිස් මහතා පාඨකයා නොමග යැවීමට උත්සාහ කරන්නේ තමා කරන දේ මා ද කර ඇතැයි පවසමිනි. ඒ සමග මා කර ඇති දේ සැඟවීමට ද ඔහු උත්සාහ ගනියි. අපි ඒ මහතාගේ ඔක්තෝබර් මස 14 වැනි දින දරණ ලිපියෙන් උපුටා දක්වමු. "වර්තමාන බලධාරීන් ද අපේ පැරණි ගැමි සම්ප්‍රදායේ ම උදවිය නම් අප ගේ උත්සාහය තේරුමක් නැත. එය එසේ නොවන නිසා අප ගේ උත්සාහය වැදගත් වෙයි. වර්තමානයේ විශේෂයෙන් ඊනියා සංවර්ධන වැඩ කටයුතු සිදු වන්නේ ගැමියන් ගේ වුවමනා එපාකම් මත නො වේ. (ඇත්තට ම වර්තමානයේ සංවර්ධනය ආදිය පිළිබඳ ගැමියන්ගේ අදහස් මතිමතාන්තර අපේ සම්ප්‍රදායට බොහෝ විට එකඟ ද නැත.).. .. .. .. අපේ ගැමියනට (මිනිසුන්ට) මේ වැව්වල අගය හොඳින් දැනීම, ඒවා රැකගත යුතු බව දැනීම ආදිය සහ වර්තමානයේ බටහිර චින්තනය තුළ ඒවා ක්‍රියාත්මක කිරීම යනු කරුණු දෙකකි. ගැමියනට අවශ්‍ය දේ ගැමි භාෂාවෙන් ප්‍රකාශ කිරීමෙන් එතරම් ඵලක් නැත. .. .. .. මෙරට දෙමළ ජාතිවාදයට (සහ ඒ ආශ්‍රිත අනෙක් ක්‍රියාවනට) මෙරට අති බහුතරය විරුද්ධ බව අපි දනිමු. එහෙත් ඔවුන්ගේ භාෂාවෙන් (එම තර්ක මගින්) එය ප්‍රකාශ කිරීමට ඉඩ හැරියේ නම් එය (දෙමළ ජාතිවාදය සහ ඒ මත වූ ත්‍රස්තවාදය) කිසි දා පරාජය වනු ඇත් ද? එය පරාජය වූයේ ප්‍රධාන වශයෙන් නලින් ද සිල්වා මහතා ඉදිරිපත් වී එම ගැමි අදහස් සහ මතිමතාන්තර (ඉතිහාසය ආදිය ද සමග) උකහාගෙන ඒවා බටහිර ගණිතයේ වියුක්ත තර්ක ක්‍රමවල ද ආභාසය ලැබ අදාළ වපසරියක් තුළ නූතන තාර්කික මනස්වලට (අදාළ පුද්ගලයනට) ගැලපෙන පරිදි ඉදිරිපත් කිරීම නිසා ය. මෙහි දී මෙලෙස තමන්ට ගැලපෙන පරිදි තර්ක ඉදිරිපත් වීම නිසා මේ අදාළ පුද්ගලයන් සියල්ලන් ම අවංකව ම මේවා පිළිගත්තේ යැයි නො පවසමි. එහෙත් ඒ ප්‍රබල (නූතන අර්ථයෙන්) තර්ක ඔස්සේ විශාල පෙරළියක් සිදු විය."

"පැරණි තාක්ෂණ සම්ප්‍රදාය නූතන බලධාරීන්ට ගැළපෙන පරිදි නිව්ටෝනීය සන්දර්භය තුළ විස්තර කර දීම ද එවැන්නකි. අපේ පැරණි තාක්ෂණයන්හි (හා අනෙක් දෑහි) වැදගත්කම, බටහිර විද්‍යාත්මක චින්තනයෙන් තම ඔළු කුරුවල් නො කර ගත් ගැමියනට කොහොමත් පැහැදිලි ය. ඒ සඳහා අමුතුවෙන් නිව්ටන් අවශ්‍ය නැත. එහෙත් එම සම්ප්‍රදාය තුළ හිඳිමින් යමක් අලුතෙන් නිමැවීමට සමත් ගැමියන් වර්තමානය වන විට අතිශය දුර්ලභ ය. (නැති තරම් ය) එනම් ඔවුහු ඒ පැරණි ප්‍රවාද (හෝ එවැනි යමක්) නො දනිති. මේ නිසා ඒ පැරණි ප්‍රවාද සොයාගන්නා තෙක් හෝ නව ඒවා නිමැවෙන තෙක් හෝ නිව්ටන් අවශ්‍ය ය. ගෙඩි පිටින් නිව්ටන් නොව ඔහුගේ ලෝකයෙන් මුදාගත් නිව්ටන් ය."

මා මගේ පිළිතුරුවල බොහෝ විට ඒ ඒ ලිපියෙහි අදාළ කොටස් ඇතැම් විට නැවතත් උපුටා දක්වන්නේ අදාළ ලිපිය සඳහන් කළ ද බොහෝ පාඨකයන් ඒ ලිපි නැවතත් නොකියවන බැවිනි. එවිට ඒ කියා ඇති දේ නිවැරදිව මතකයෙහි රැඳී නැත්නම් එයට දෙන පිළිතුර හරිහැටි අවබෝධ කරගැනීමට පාඨකයාට යම් දුෂ්කරතාවක් පැන නගී. දැන් අපි ඉහත සඳහන් ඡේද දෙක සලකා බලමු. පළමු ඡේදයෙහි කපිල පීරිස් මහතා පරස්පර කතා කියයි. පැරණි ගැමි සම්ප්‍රදාය ගැන කපිල පීරිස් මහතා සඳහන් කරන්නේ පැරණි ගැමියන් අපේ සම්ප්‍රදාය අපේ සංවර්ධනය ආදිය ගැන දැන සිටි බවට සැකයක් නැත යන තේරුමෙනි. එහෙත් වත්මන් ගැමියන් ගැන ඒ මහතා කියන්නේ කුමක් ද යන්න ඒ මහතාගේ ලිපි කියවීමෙන් අවබෝධ කරගත හැකි නො වේ. වර්තමාන සංවර්ධනය ආදිය ගැන ගැමියන් (වත්මන් විය යුතු ය) දක්වන අදහස් අපේ සම්ප්‍රදායට බොහෝ විට එකඟ නැතැයි ඒ මහතා කියයි. එහෙත් ඒ ඡේදයෙහි ම ඒ මහතා කියන්නේ අපේ ගැමියනට වැව්වල අගය දැනීම හා ඒවා රැකගත යුතු බව දැනීම තිබෙන බව ය. කුඩා වැව් කඩා දැමීමට ගැමියන් විරුද්ධ නොවනු ඇතැයි ද කපිල පීරිස් මහතා කීවේ ගැමියන් සංවර්ධනය පිළිබඳ දක්වන අදහස් අපේ සම්ප්‍රදායට බොහෝ විට එකඟ නැති බව කියමින් ය. මෙහි පරස්පරයක් ඇති බව කපිල පීරිස් මහතාට නො වැටහෙන්නේ ද?

දෙවැනි ඡේදයෙහි කපිල පීරිස් මහතා බටහිර චින්තනයෙන් ඔළු කුරුවල කර නොගත් ගැමියනට අපේ පැරණි තාක්ෂණයෙහි ඇති වැදගත්කම කොහොමටත් පැහැදිලි යැයි කියයි.. එවිට අර ගැමියන් සංවර්ධනය ගැන දක්වන අදහස් අපේ සම්ප්‍රදායට බොහෝ විට එකඟ නොවන්නේ යැයි කියන විට එයින් කියැවෙන්නේ වෙනත් ගැමියන් පිරිසක් ගැන ද? ඒ සමග කපිල පිරිස් මහතා සැප්තැම්බර් 23 වැනි දා ලියූ මේ කොටස ද කියවන්න. "හද්දා පිටිසර ගැමියන්

© Prof. Nalin De Silva

පමණක් නොව ඇතැම් පුරා විද්‍යාඥයන් සහ මේවා පිළිබඳ විමසිලිමත් වන බොහෝ දෙනා මේවා අද විග්‍රහ කරන්නේ නිව්ටන් ගේ ලෝකයේ සංකල්ප වැරදි ලෙස යොදා ගනිමින් ය.’’

හද්දා පිටිසර ගැමියන් යනු වෙනත් ගැමියන් පිරිසක් ද? ඔවුන් නිව්ටන්ගේ ලෝකයෙහි සංකල්ප වැරදි ලෙස යොදා ගන්නේ බටහිර චින්තනයෙන් ඔළු කුරුවලු කර නො ගෙන ද? කපිල පීරිස් මහතාට කබරගොයා එකම ජේදයෙහි කබරගොයා ද තලගොයා ද බවට පත්වෙයි. ලිපි දෙකක දී නම් අවශ්‍යතාව පරිදි කබරගොයා කිඹුලකු හෝ හූනකු හෝ බවට ද පත්වෙයි. තමන් ලියන්නේ කුමක් ද යන්න පිළිබඳ ව ඒ මහතාට එතරම් වැටහීමක් ඇති බවක් පෙනෙන්නට නැත. ගැමියනට අවශ්‍ය දේ ගැමි භාෂාවෙන් ප්‍රකාශ කිරීමෙන් එතරම් ඵලක් නැතැයි ඒ මහතා කියයි. මෙහි දී ගැමියනට අවශ්‍ය දේ කුමක් ද යන්න පැහැදිලි නැත. ඒ කුමක් වුවත් ගැමියනට අවශ්‍ය දේ කිවයුත්තේ ගැමි භාෂාවෙන් නොවේ නම් වෙනත් කිනම් බසකින් ද?

දෙමළ ජාතිවාදය සම්බන්ධයෙන් මා විසින් කරන ලද කාර්යය ගැන කපිල පීරිස් මහතාට කිසිම වැටහීමක් නැත. කලින් ලිපියෙහි ද කියා ඇති පරිදි මගේ අවශ්‍යතාව වූයේ සිංහලත්වයේ වැදගත්කම ගැන බටහිරයන්ට තේරෙන බසකින් කියා දීම නො වේ. මම ඇතැම් විට බටහිරයන්ගේ වියුක්ත තර්ක යොදා ගත්තෙමි. එහෙත් එහි දී නිව්ටෝනීය ප්‍රවාද හෝ වෙනත් බටහිර ප්‍රවාද හෝ යොදා නො ගැනිණි. මම අපේ සංස්කෘතියෙහි ගැමියන් දත් දේ අනුව ඇතැම් විට ඒ මත පදනම් වී ප්‍රවාද නිර්මාණය කෙළෙමි. ඒ හැමියන් දත් දෙයක් බටහිරයන්ගේ බසකින් කීම නො වේ. අපේ සංස්කෘතියෙහි අපේ ප්‍රවාද නිර්මාණය කිරීමකි. ඇතැම් විට ගැමියන් දත් දෙයට හා වංසකතාවල සඳහන් දෙයට පරිබාහිරව ද ගියෙමි. උදාහරණයක් වශයෙන් එළාර රජු සොළී හෝ වෙනත් දෙමළ වංසයක හෝ නොවේ යැයි මම කීවෙමි. ඒ ගැමියන් දත් දෙයට පටහැණි වූවකි. මෙරට දෙමළ ඉතිහාසය ආරම්භ වූයේ ලන්දේසි යුගයේ දී යැයි මම කියමි. මා ඒ බව පවසන්නේ කිසිම බටහිර ප්‍රවාදයක් ඇසුරු කරමින් නො වේ. මගේ හිතුමතයට ද නො වේ. මම සිංහල බෞද්ධ සංස්කෘතියට සාපේක්ෂව සංගතව ඒ ප්‍රවාද නිර්මාණය කෙළෙමි. ඒ ප්‍රවාද හා ඉතිහාසයේ අනෙක් බොහෝ ප්‍රවාද,  සංකල්ප හා දත්ත අතර විසංවාද නො වේ.

බෞද්ධයනට යුද්ධකිරීම කැප ද යනුවෙන් අසන විට අප දුන් පිළිතුරු ථෙරවාදයට අකැප යැයි හිදිසියේ ශ්‍රද්ධාසම්පන්න බෞද්ධ මහෝපාසකයන් බවට පත් වී ඇති පඬියන්ට කිව හැකි ය. ඔවුන්ට අවශ්‍ය නම් තම්බයියා මහතා සමග එක් වී බුදුදහම පාවාදීම ගැන කතාකළ හැකි ය. අප පිළිතුරු දුන්නේ බටහිර පඬියන්ට මේ සියල්ල පැහැදිලි කර දීම සඳහා නම් නො වේ. බටහිරයෝ අප කියන කිසිවක් නො පිළිගනිති. හෙට ද නොපිළිගනු ඇත. අප කෙළේ ඔවුන් නිරුත්තර කිරීම පමණකි. එහෙත් එසේ නිරුත්තර කෙළේ බටහිරයන්ගේ දේශපාලන, සමාජ විද්‍යාත්මක හෝ ආර්ථික හෝ වෙනත් ප්‍රවාද  යොදා ගනිමින් නො වේ. බටහිර ප්‍රවාද යොදා ගනිමින් ඒ කළ නොහැකි බව අපි දැන සිටියෙමු. කපිල පීරිස් මහතා නිව්ටෝනීය ප්‍රවාද යොදාගන්නා ආකාරයට මම බටහිර ප්‍රවාද යොදා නොගත්තෙමි. එහෙත් මා වියුක්ත තර්ක යොදාගත් බව පැහැදිලි ය. එහි දී මා කෙළේ වියුක්ත තර්කය අපේ සංස්කෘතියට ගැනීම පමණකි. අපේ චින්තනයෙහි වියුක්තය අඩු බවත් අප වියුක්තය අපේ චින්තනයට ලබාගත යුතු බවත් (අවශෝෂණය කළ යුතු බවත්) මා කියා ඇත්තේ අද ඊයේ නො වේ. ඒ පිළිබඳ මගේ දෙගිඩියාවක් හෝ කුකුසක් හෝ නැත.

අප විසින් ආමන්ත්‍රණය කරනු ලැබුවෝ මෙරට බහුතර සිංහලයෝ ය. ඔවුහු සමහරු උගත්හු වූහ. එනම් ඔවුහු බටහිර උගත්හු වූහ. අපි පළමුවෙන් ඔවුන් නිරුත්තර කෙළෙමු. තර්ක හෝ ප්‍රවාද හෝ මගින් ඔවුන් සිංලත්වය ඇගයීමට නො පෙළඹුණහ. අප කෙළේ පුවත්පත්වලට හා සඟරාවලට ලිවීම පමණක් නො වේ. ඇතැමුන් අපට ඒ චෝදනාව එල්ල නොකළා නො වේ. අප මූලික ව කතා කෙළේ මෙරට ගැමියන්ට ය. අපි ඔවුන්ගේ බස කතා කෙළෙමු. ඇතැම් විට ඒ පන්සල්වල කෙරුණු සම්මන්ත්‍රණ විය හැකි ය. ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් නොව මොණරාගල දිස්ත්‍රික්කයේ ද බදුල්ල දිස්ත්‍රික්කයේ ද වෙනත් දිස්ත්‍රික්කවල ද අපි සම්මන්ත්‍රණ පැවැත්වීමු. ජාතික එකාබද්ධ කමිටුව නම් සංවිධානයක් ඔස්සේ සිංහල කොමිසමක් පත්කර ඒ මගින් ජනතා ප්‍රබෝධයක් ඇති කෙළෙමු. සිංහල කොමිසම සාක්ෂි සටහන් කර ගැනීම සඳහා දිස්ත්‍රික්කයක් දිස්ත්‍රික්කයක් පාසා ගියේ ය. එහි දී එවකට විපක්ෂය කුමාරතුංග මහත්මියගේ ආණ්ඩුවට විරුද්ධව ජාතික එකාබද්ධ කමිටුවට ආධාර කළ බව රහසක් නො වේ. අපි ඒ පක්ෂයේ ආධාරකරුවන් සමග ගැටුම් ඇතිකරගනිමින් ම එහි වැඩ කෙළෙමු. අවසානයේ දී අපි කමිටුවෙන් පළවා හරිනු ලැබුයෙමු. අපට මූලික වශයෙන් අවශ්‍ය වූයේ ඒ වැඩ ඔස්සේ ජන මතයක් ඇතිකිරීම ය.

© Prof. Nalin De Silva

ජාතිය යනු මළ කඳක් බව පවසමින් තමන්ට ඒ කරගසාගෙන යෑමට නොහැකි යැයි අද සංධානයට සම්බන්ධ ඇතැම් පක්‍ෂ එදා කියද්දී අපි ජාතිය යනු ජීවමාන වුවක් බව පෙන්වීමට කටයුතු කෙළෙමු. ගැමියන්ගේ බස කතාකිරීම යනු හුදෙක් ගැමියන්ට තේරෙන සිංහල බසින් කතාකිරීම නො වේ. අප අනූහතරේ මැතිවරණයට ඉදිරිපත් වූයේ ද ගැමියනට කතා කිරීමට ය. ඒ මැතිවරණයෙන් අප පරාජය වූ නමුත් වර්තමාන පිබිදීම ඇරඹුණේ අප ඒ මැතිවරණයේ දී තරඟ කිරීමත් සමග ය. මැතිවරණයේ දී ජාතිය මළ කඳක් බවට පත්වී තිබුණි යැයි කී දේශපාලන පක්‍ෂයක් වැඩිකල් නොගොස් ජාතියට පණ ඇති බව තේරුම් ගත්තේ ය. ඒ අතර අපි ගැමියන්ට තේරෙන ආකාරයට පාද යාත්‍රා රථ යාත්‍රා සංවිධානය කෙළෙමු. අප කතරගම ගියේ වියුක්ත කතාකීමට නොව අතරමඟ සිටි සියලු ජනතාවට තොරෙන බසින් මුවින් නොබැණ වැඩම කළ භික්‍ෂූන් වහන්සේ මගින් පණිවුඩයක් දීමට ය. මෙරට ජාතික සන්නිවේදනයෙහි නියමුවෝ භික්‍ෂූන් වහන්සේ ය. උන්වහන්සේලා මුවින් නොබැණ වැඩම කිරීම ම වැදගත් සන්නිවේදනයක් විය. ඒ ගැමියන්ට තේරෙන බසකින් කතාකිරීම මිස අනෙකක් නො වේ. ක්‍රමයෙන් ජාතිකත්වයට ජනතා රැල්ලක් ඇති බව තේරුම් ගත් දේශපාලන පක්‍ෂ අපේ පදයට නටන්නට පටන් ගත්තේ ය. එංගලන්තයේ චාල්ස් කුමරු යැයි සඳහන් කෙරෙන තැනැත්තාගේ ප්‍රධානත්වයෙන් ඊනියා නිදහසේ පනස්වසර සමරද්දී අපි  ඌව වෙල්ලස්ස නිදහස් සටනේ සෙනෙවියන් ඌවේ දී සැමරුවෙමු. තම්බයියාගේ බුදදහම පාවාදීමට එරෙහිව පොත් පිංචක් පළකිරීමට අමතරව අපි සම්මන්ත්‍රණ පැවැත්වූයෙමු. පුවත්පත්වලට (දිවයිනට) ලිවෙමු. ඒ සියල්ල ජනමතයක් ඇතිකිරීම සඳහා විය.

මේ සියල්ල මා විසින් පමණක් කරනු ලැබූ දෑ නො වේ. විවිධ පුද්ගලයෝ එයට සම්මාදන් වූහ. එහි දී වඩා වැදගත් වූයේ ජනතාව ය. ගැමි ජනතාව ය. ජනතාවගේ ජාතිකත්වය පනස්හයෙන් ටික කලකට පසුව මකා දමා තිබිණි. අපට අවශ්‍ය වූයේ ඒ ජාතිකත්වය නැවත ඇති කරලීම ය. අපි පනස්හයක් යළි පැමිණෙන බව දැනගෙන  ඒ අනුව ජනතාව සූදානම් කිරීමට වැඩ කෙළෙමු. ඒ අතර පඬියන් දැනුවත් කිරීමට නොව නිරුත්තර කිරීමට අපි වියුක්ත ව තර්ක කෙළෙමු. ඔවුන් අපේ තර්ක පිළිගත්තා නො වේ. අප කෙළේ මේ පඬියන්ට බටහිර ප්‍රවාද මගින් කිසිම දෙයක ඊනියා වැදගත්කමක් කියා දීමක් නම් නො වේ. කපිල පීරිස් මහතා මේ සම්බන්ධයෙන් කියන සියල්ල වැරදි ය. ඔහු තම ව්‍යාපෘතිය යුක්තියුක්ත කිරීම සඳහා අප කළ දෑ විකෘති කරයි. ජනමතයක් ඇතිවීමත් සමග ක්‍රමයෙන් පක්‍ෂ කිහිපයක් හැරෙන්නට අනෙක් දේශපාලන පක්‍ෂ අපේ මතයට, එනම් ජාතිකත්වයේ මතයට පැමිණීමත් සමග එක් යුගයක් අවසාන විය. ඉන්පසු ඒ කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් විය. අද දෙමළ ත්‍රස්තවාදය පරාජය කෙරී ඇත. එහෙත් දෙමළ බෙදුම්වාදය හා දෙමළ ජාතිවාදය තවදුරටත් වෙයි. අපි එය ද පරාජය කරමු. ඒ අතර බුදුදහම පිළිබඳ අප කළ විවරණ වෙනුවෙන් අපි පෙනී සිටිමු. බුදුදහම විවරණය කළ පළමු තැනැත්තා හෝ අවසාන තැනැත්තා හෝ මා නො වේ. එහෙත් විවරණ ගැන කතාකිරීමට පෙර කපිල පීරිස් මහතාගේ ඊනියා ඉංජිනේරු සම්ප්‍රදායේ පරස්පරය සාකච්ඡා කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva